හානිපූරණය සඳහා වන කාර්යාලය - **2024**

--------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවරකිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 70 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ජංගම හා ජංගම නොවන වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුහුණතෙහි වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කළ යුතු වුවත්, ඒකාබද්ධ ණය සහනාධාර යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය ආයතනවල ආයෝජනයකර, කල්පිරුනු පසු නැවත භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු සම්පූර්ණ මුදල වන රු.122,432,713ක් ජංගම නොවන බැරකම් යටතේ හඳුනාගෙන තිබුණි. ඉන් ඉදිරි වර්ෂය තුළ කල්පිරෙන රු.67,500,000ක් වූ ආයෝජන ජංගම බැරකම් ලෙස හඳුනාගැනීම නිසා ජංගම බැරකම් අඩුවෙන් හා ජංගම නොවන බැරකම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී සිදු වූ මෙකී දෝෂය 2025 වර්ෂයේ අවසාන ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 70 ඡේදය ප්‍රකාරව කටයුතුකළ යුතු ය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ | 2025 වර්ෂයේ අවසාන ගිණුමෙන් මෙකී හෙළිදරව සිදුකිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි 65 ඡේදය ප්‍රකාරව ජීව කාලය සමාලෝචනය කිරීමට පියවරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නම් එම වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3හි ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු ය. එහෙත් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2024 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද තවදුරටත් භාවිතයට ගනු ලබන පිරිවැය රු.823,515ක් වූ ලීබඩු හා කාර්යාල උපකරණවලට අදාළව එපරිදි කටයුතුකර නොතිබුණි. | | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 අප්‍රේල් 28 දින සිට ක්‍රියාත්මක කරන ලද රු.10,819,625ක් වටිනා පරිගණක දත්ත පද්ධතිය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස හදුනාගෙන නොතිබුණු අතර, 2023 වර්ෂය සඳහා වූ රු.735,141ක් වූ ක්‍රමක්ෂය 2024 වර්ෂයේ දී වියදමක් ලෙස හදුනාගැනීම නිසා ප්‍රවර්ථන වර්ෂයේ ඌණතාවය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදි ය. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවරගත යුතු ය. |
| (ආ) | සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (IOM) මගින් ප්‍රජාපාදක ක්ෂුද්‍ර ව්‍යාපෘති ස්ථාපිත කිරීම වෙනුවෙන් 2024 වර්ෂය තුළ ප්‍රදානය කළ රු.20,916,444ක මුදල කාර්යාලයේ පුනරාවර්තන ප්‍රදානයක් ලෙස හදුනානොගෙන සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධාන අරමුදල් ගිණුමට බැරකර තිබුණි. | නිරීක්ෂණය නිවැරදි ය. | පුනරාවර්තන ප්‍රදානයන් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවරගත යුතු ය. |
| (ඇ) | 2024 වර්ෂයේ ප්‍රජාපාදක ක්ෂුද්‍ර ව්‍යාපෘතිය සඳහා අදාළ වන රු.12,787,722ක වියදම වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ හදුනාගෙන නොතිබුණි. | 2024 වර්ෂය වෙනුවෙන් දැනටමත් හදුනාගෙන ඇති වියදම 2024 වර්ෂයේ අවසාන ගිණුමේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය නැවත ප්‍රකාශ කිරීම මගින් නිවැරදි කිරීමට සටහන්කර ගතිමි. එමෙන්ම ඉදිරියේදී ලැබෙන මෙවන් ප්‍රදානයන් ගිණුම් තැබීමේ දී ඔබගේ | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවරගත යුතු ය. |

නිරීක්ෂණයන් මගින් පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කරමි.

## 1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 272(1) ඡේදය | ගෙවූ සියලුම වවුචර ක්‍රියාමාර්ග ගන්නා තෙක් ඒවායේ අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්ෂා සහිතව තබාගත යුතු අතර, ලියවිලි භාරව සිටින නිලධාරීන් ඒවා බලය නොලත් තැනැත්තන්ට අසුනොවන සේ සුරක්ෂිතව තබාගත යුතු ය. නමුත් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙන් ලද අරමුදල් භාවිතයෙන් කරන ලද වියදම් සඳහා වූ වවුචර් එපරිදි සකස්කර නොතිබුණි. | ගෙවන ලද සියලුම වවුචර්පත් ක්‍රමවත් පරිදි සකස්කර මුදල් රෙගුලාසි 272(1) ප්‍රකාරව ආරක්ෂිතව පවත්වාගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු ය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | (i) 9(ආ) ඡේදය | කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් කිහිපදෙනෙකු එකතු වී රු.100,000කට වඩා වැඩියෙන් තත්කාර්යය අතුරු අග්‍රිම අවස්ථා 08ක දී කොටස්කර රු.2,377,480ක අත්තිකාරම් මුදල් ලබාගෙන වියදම්කර තිබුණි. | වැඩසටහන් සියල්ල කොළඹින් බැහැර උතුරු නැගෙනහිර විපතටපත් ආන්තික සමාජීය කණ්ඩායම් සඳහා සිදුකළ යුතු හානිපූරණයන් ය. සාමූහික හානිපූරණයන් ප්‍රදානය කරනු ලබන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අත්තිකාරම් මුදල් කොටස්කර අදාළ කාර්යයන් සඳහා | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගත යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබාගෙන උතුරු නැගෙනහිර ප්‍රදේශයට ගොස් අදාළ කාර්යයන් සිදුකරන අතර, රු.100,000 ඉක්මවා කිසිවිටක එක් නිලධාරියෙකුට තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී නොමැත. | |
| | (ii) 11.1 වගන්තිය හා මුදල් රෙගුලාසි 756(6) | භාණ්ඩ සමීක්ෂණයේ කාර්යයන් 2025 මාර්තු 31 දිනට පෙර අවසන්කර එම වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කළ යුතු වුව ද, එපරිදි කටයුතුකර නොතිබුණි. | 2024 වර්ෂයට අදාළව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන්කර ඇති අතර, භාණ්ඩ සමීක්ෂණ වාර්තා අමාත්‍යාංශ ලේකම් වෙත හා විගණකාධිපති වෙත යැවීමට කටයුතු සූදානම් කර ඇත. | මුදල් රෙගුලාසිවල සඳහන් කාල සීමාව තුළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අදාළ වාර්තා අයතනය වෙත යැවීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදයේ උපලේඛන 1හි 3 ඡේදය | ප්‍රධාන අයවැය ලේඛනය තුළ ඇතුළත් විය යුතු පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, පුරෝකථනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා පුරෝකථනය කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 2024 වර්ෂයේ අයවැය ලේඛනය තුළ ඇතුළත්කර නොතිබුණි. | 2025 වර්ෂයේ දී අයවැය ලේඛනය සමග පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අංක 01/2021 දරන රාජ්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඈ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය | අවම වශයෙන් වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකළ යුතු වුව ද, එවැනි සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | හානිපූරණ කාර්යාලයේ දැනට පවතින්නේ සුළු ප්‍රසම්පාදන මණ්ඩලයකි. ඉදිරියේ දී වසර 03ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සෑදීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ඉ) | 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016හි 6 ඡේදය සහ 2018 ජූලි 16 දිනැති ජාතික | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති මෝටර් රථය සඳහා 2023 ඔක්තෝබර් 05 දින සිට 2024 දෙසැම්බර් 31 දින | සභාපතිතුමියගේ නිල රාජකාරි සඳහා WP CAW – 0173 දරන කාර් රථය කල්බදු ක්‍රමය යටතේ 2023 | අයවැය චක්‍රලේඛයන් ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| අයවැය චක්‍රලේඛ අංක 03/2018 හි 05(ඈ)ii(ඊ) ඡේද | දක්වා මෝටර් රථය ලබාදුන් ආයතනය සහ හානිපූරණය සඳහා වන කාර්යාලය අතර කිසිදු ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීමක් සිදුනොකර, අදාළ මෝටර් රථය භාවිතාකර තිබුණි. | ඔක්තෝබර් 02 දින සිට වසරක කාලයක් සඳහා මිලදීගැනීමේ කටයුතු සිදුකළ ද, ඉන් පවත්නා මිලගණන් අනුව සැපයුම්කාර ආයතනය විසින් වාහනය ලබාදීම ප්‍රතික්ෂේපකර ඇත. ඒ අනුව 2023 ඔක්තෝබර් 02 දින සිට 2024 ඔක්තෝබර් 01 දින දක්වා කාල සීමාවට 2023 නොවැම්බර් 09 දිනැතිව පවත්වන ලද ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී. ගිවිසුම් පිටපත් අත්සන් තැබීමට අතපසු වී ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,276,563ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.13,642,455ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.12,365,892ක වර්ධනයක් නිරීක්ෂණය වේ. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන තුළ ඇතුළත් වන්දි සඳහා භාණ්ඩාගාර අක්මුදල් ආදායම වැඩිවීම හා ප්‍රාග්ධන ප්‍රදානවල වැඩිවීම, ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වෙනත් හානිපූරණ ප්‍රදානයන් යටතේ සැලසුම්කර තිබූ වැඩසටහන් 4ක් වෙනුවෙන් එකතුව රුපියල් මිලියන 17ක් හානිපූරණය සඳහා වන කාර්යාලයේ 2024 අයවැයෙන් වෙන්කර තිබුණු අතර, ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී වෙන්කරන ලද මුදල්වලින් සියයට 73ක් උපයෝජනය වී නොතිබුණි. | 2024 අයවැය මගින් වෙනත් හානිපූරණයන් ලෙස ක්‍රියාත්මක කිරීම, ජීවනෝපාය සහාය සංවර්ධනය, මනෝ සමාජීය සහාය, පරිපාලන සහාය සහ සාමය හා සංහිදියාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් සැලසුම්කොට මුදල් වෙන්කොට තිබුණු අතර, ජීවනෝපාය සහ මනෝ සමාජීය සහාය වැඩසටහන් ලද විදේශ ආධාර ප්‍රදානයන් මගින් ක්‍රියාත්මක කරන ලදී. ඉතිරි මුදල් යුද්ධයෙන් දේපළ හානිවූවන්ට | අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස්කර ප්‍රතිපාදන ලබා ගැනීමට පියවරගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | මූල්‍ය සහන ලබාදීමට උපයෝගී කොට ඇත. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මරණ හා තුවාල සම්බන්ධයෙන් වන ලිපිගොනු 3,495කට අදාළව වන්දි මුදල් ලෙස රු.698,860,000ක මුදලක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වන්දි සාමාන්‍ය මහජන වන්දි ක්‍රමවේදයන් යටතේ ලිපිගොනු 33ක් සඳහා රු.6,185,000ක් වන්දි ගෙවිය යුතුව පැවතුණු අතර, මෙම වන්දි මුදලට අදාළ කාලවිශ්ලේෂණයට අනුව වසර 1ත් 5ත් අතර වූ ලිපිගොනු 23ක් ද, වසර 5ත් 10ත් අතර වූ ලිපිගොනු 10ක් වූ බැවින්, වන්දි ගෙවීමේ සැළකිය යුතු ප්‍රමාදයක් පැවැතුණි. | ගෙවීම් සඳහා අත්‍යාවශ්‍ය ලේඛන අසම්පූර්ණතාවය මත සාමාන්‍ය මහජන වන්දි - මරණ හා තුවාල සඳහා වූ ලිපිගොනු 33ක් ආයතනය සතුව පවතී. එම ලිපිගොනු සඳහා අවස්ථා කිහිපයකදීම තොරතුරු කැඳවා ඇති නමුත්, ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. අදාළ ලිපිගොනු මියගිය පුද්ගල ලිපිගොනු බැවින් ප්‍රතිලාභියාට සහන සැලසීම අත්‍යාවශ්‍ය බැවින් එම ලිපිගොනු පවත්වාගෙන යනමුත් ඉදිරියේ දී ප්‍රතිලාභීන් විසින් ප්‍රතිචාර නොදක්වයිනම් එම ලිපිගොනු වසා දැමීමේ ක්‍රියාමාර්ගය වෙත යොමු කරන බව සඳහන් කරමි. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින ලිපිගොනු සඳහා වන්දි මුදල් ගෙවීමට විධිමත් ක්‍රියාමාර්ගගත යුතු ය. |
| (ආ) | 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ සඳහා වූ වන්දි ක්‍රමවේදය යටතේ ලිපිගොනු 7,459ක් සඳහා රු.924,184,606ක දේපළ වන්දි ගෙවා තිබුණු අතර, තවදුරටත් එම වන්දි ක්‍රමවේදය යටතේ සාමාන්‍ය මහජන දේපළ සඳහා ලිපිගොනු 3,060ක් වන්දි ගෙවීමට පැවතුණි. එම ලිපිගොනු සියල්ලම වර්ෂ 10කට වඩා පැරණි ලිපිගොනු විය. | දේපළ සඳහා වූ වන්දි ලිපිගොනු 2425ක් අත්‍යාවශ්‍ය ලේඛන අසම්පූර්ණතාවය මත ගෙවීම් සිදු කිරීමට නොහැකිව ආයතනය සතුව පවතින අතර, අවස්ථා කිහිපයකදීම තොරතුරු කැඳවා ඇති නමුත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. තව ද, පූජනීය ස්ථාන සඳහා වූ ලිපිගොනු 553ක් එම විෂයට ගෙවීම් නොකිරීම හේතුවෙන් ආයතනය සතුව පවතී. එම ලිපිගොනුවල ලේඛන අසම්පූර්ණතාවය මත ගෙවීමට ඇති වන්දි මුදල තක්සේරු කළ නොහැකි ය. රාජ්‍ය සේවක දේපළ වන්දි ලිපිගොනු ගෙවීම් කිරීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 49/89 යටතේ අත්‍යාවශ්‍ය ලේඛන සම්පූර්ණ නොවීම මත ලිපිගොනු 82ක් ආයතනය සතුව පවතින අතර, තොරතුරු කැඳවා ඇති නමුත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොමැත. | වන්දි ලිපිගොනුවලට අදාළ ලේඛන කඩිනමින් සම්පූර්ණ කරගෙන වන්දි ගෙවීමට පියවරගත යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2022 වර්ෂයේ සිදු වූ අරගලයෙන් මරණ හා තුවාල සිදුවූවන් සඳහා වූ වන්දි ලිපිගොනු 6ක් සඳහා 2024 දෙසැම්බර් 31 දිනට රු.30,000,000ක් ගෙවීමට පැවතුණි. තව ද, එම සිදුවීමෙන් හානියට පත් දේපළ සඳහා වූ වන්දි ක්‍රමවේදය යටතේ නිශ්චල දේපළ 128ක් හා චංචල දේපළ 453ක් සඳහා වූ ලිපිගොනු අසම්පූර්ණ හා තක්සේරු වාර්තා නොමැතිකම නිසා ගෙවීමට ඇති වන්දි මුදල සම්බන්ධයෙන් තක්සේරු කිරීමක් සිදුකර නොතිබුණි. | අරගලයෙන් මියගිය පුද්ගලයන් 06දෙනෙකු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය මගින් හා පොලිස් දෙපාර්තමේන්තුව මගින් ගෙවීම් කොට ඇත. ඉතිරි පුද්ගලයන් 04දෙනෙකු වෙනුවෙන් ගරු අධිකරණයේ නඩු කටයුතු පවතින බැවින් ලේඛන අවශ්‍යතා සම්පූර්ණ නොවීම මත ගෙවීම්කර නොමැත. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරනු ලබන තක්සේරු වාර්තාව මත පදනම්ව ගෙවීම් කරන අතර, ඉතා සුළු ලිපිගොනු ප්‍රමාණයක තක්සේරු වාර්තා පැවතුණ ද බහුතරයක් ලිපිගොනුවල තක්සේරු වාර්තා නොමැතිකම හේතුවෙන් ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය තක්සේරු කිරීමට නොහැකි බව දන්වා සිටිමි. | වන්දි ලිපිගොනුවලට අදාළ ලේඛන කඩිනමින් සම්පූර්ණ කරගෙන වන්දි ගෙවීමට පියවරගත යුතු ය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දී වන්දි ගෙවීම් සඳහා චෙක්පත් නිකුත්කළ ද වන්දිලාභීන්හට චෙක්පත් නිකුත්කරන අවස්ථාව වන විට යාවත්කාලීන නොකරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ලබාදීමේ ක්‍රියාකාරකම් සිදුකිරීම හේතුවෙන් එම ක්‍රියාවලිය නිසිපරිදි ඉටු වී නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට වන්දි ලාභීන්හට ලබා දී තිබුණු චෙක්පත් අතරින් රු.38,922,823ක් වටිනා චෙක්පත් 292ක තොරතුරු නිවැරදි නොවීම මත බැංකුව විසින් අගරුකර තිබුණි. මෙම අගරු චෙක්පත්වලට අදාළව වන්දි මුදල්වලින් රු.35,164,860ක් නැවත එම වන්දිලාභීන් වෙතම ලබා දී තිබුණු අතර, ඉන් රු.7,312,963ක් පොරොත්තු ලේඛනයේ ඉතිරි වන්දිලාභීන් 36දෙනෙකු වෙත ලබා දී තිබුණි. මේ අනුව යාවත්කාලීන තොරතුරු මත වන්දි ගෙවීමේ ක්‍රියාවලිය සිදුනොවීම හේතුවෙන් වන්දි ගෙවීමේ කාර්යක්ෂමතාවය අවම මට්ටමක පැවතුණි. | ප්‍රතිලාභීන්ට මූල්‍ය ප්‍රදානයන් සිදු කිරීමට පෙර ඔවුන් ගිණුම් තොරතුරු යාවත්කාලීනකර ලබා ගැනීමට අප හැකි සෑමවිටම කටයුතු කරනු ලබයි. ප්‍රතිලාභීන්ගේ වර්තමාන ලිපිනයන් සොයා ගැනීම නොහැකිවීම හා ගිණුම් අක්‍රීයව පැවතීම වැනි හේතූන් මත අපගේ ක්‍රියාවලිය සෑම අවස්ථාවකදීම සාර්ථක නොවනු ඇත. නමුත් 2024 වර්ෂය තුළ සිදුකරනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයන් සංඛ්‍යාව අනුව අගරු කරන ලද රු.38,922,823ක වටිනාකමෙන් රු.35,164,860ක ප්‍රමාණයක් නැවත එම ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද ගිණුම් වෙතම බැරකිරීමට හැකියාව ලැබුණි. | අදාළ ප්‍රතිලාභීන්ගේ යාවත්කාලීන කරන ලද තොරතුරු මත පදනම්ව වන්දි ගෙවීම් නිර්දේශ කිරීම කළ යුතු ය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙම කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ අවසන් වාර්තාව නිකුත් කළ පසුව 2025 ඔක්තෝබර් 08 දිනැති සංශෝධිත පිළිතුර අනුව අරගලයෙන් හානියටපත් දේපළ සම්බන්ධයෙන් වන්දි ගෙවීමට අදාළ නිරීක්ෂණ පහත දැක්වේ. | | |
| | (i) 2022 දෙසැම්බර් 06 දිනැති අංක අමප/22/1939/601-008-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විශේෂඥ වෘත්තිකයන් හයදෙනකුගෙන් යුත් කමිටුවක් විසින් නිර්දේශ කරනු ලබන මාර්ගෝපදේශයක් ඔස්සේ නව තක්සේරු කිරීම් සිදුකිරීමට රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙත නියමකර තිබුණි. ඒ අනුව පළමු තක්සේරු කිරීම්වලට අදාළ දේපළ සම්බන්ධයෙන් නැවත තක්සේරු කිරීම් සිදුකිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබූ අතර, මුල් තක්සේරු කිරීම සහ දෙවන හෝ තෙවන තක්සේරු වටිනාකම් සියයට 10 සිට සියයට 72ක පරාසයක් තුළ අවස්ථා 39ක දී විචලනය වී තිබුණි. | 2022 සැප්තැම්බර් 22 දිනැති PS/CM/PCA/61/2022 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කරන ලද යෝජනා ත්‍රිත්වය අතුරින් තෙවන යෝජනාව ලෙස "තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන නව තක්සේරු පදනම්කර ගනිමින් අත්තිකාරම් / මුළු මුදල ගෙවීමට කටයුතු කරන ලෙස හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නියමකිරීම" ඉදිරිපත් කර ඇති අතර, එම යෝජනාව ඇතුළුව අනෙකුත් යෝජනා සඳහා 2022 නොවැම්බර් 28 දිනැති අංක 22/1939/601/008-1 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දී ඇත. හානියට පත් දේපළ තක්සේරුකරණය හානිපූරණය සඳහා වන කාර්යාලයේ පාලනයෙන් තොර කාර්යයක් බවත්, තක්සේරු වටිනාකම් විචලනය පිළිබඳව හෝ නැවත තක්සේරුකරණයක් සම්බන්ධයෙන් පාදක වූ හේතූන් පිළිබඳව වාර්තා කරනයද හානිපූරණය සඳහා වන කාර්යාලයට පැවරී නොමැති කාර්යයක් බවත්, කාරුණිකව දන්වා සිටිමි. | ආයතන අතර මනා සම්බන්ධීකරණයක් මගින් මෙම තක්සේරු කිරීම් වඩාත් නිවැරදි හා විනිවිදභාවයකින් යුක්තව සිදුකර වන්දි ගෙවීමට කටයුතුකළ යුතු අතර, විගණන වාර්තා සඳහා නිවැරදි පිළිතුරු නියමිත කාලය තුළ ලබාදීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2022 මැයි 09 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අරගලය සම්බන්ධයෙන් වූ වන්දි ගෙවීම් ක්‍රියාවලිය තුළ ව්‍යාපාර පරිශ්‍රයන් වෙනුවෙන් වන්දි ගෙවීමේ දී, ඇගයීම් නිර්ණායක ලෙස කුඩා පරිමාණයේ ව්‍යාපාර, ලියාපදිංචි නොකළ කුඩා පරිමාණයේ ව්‍යාපාර යන ව්‍යාපාර වර්ග සඳහන්ව තිබුණි. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් කුඩා පරිමාණයේ ව්‍යාපාර අර්ථ දැක්වීමක් හෝ ප්‍රමාණාත්මකව හඳුනාගැනීමේ මිනුම් භාවිතා කිරීමකින් තොරව 2024 වර්ෂය තුළ රු.77,215ක සිට රු.5,134,350ක් දක්වා පරාසකින් ව්‍යාපාර පරිශ්‍රයන් 14ක් වෙනුවෙන් රු.12,416,190ක් වන්දි ගෙවා තිබුණි. එයින් රු.2,239,450ක් පෞද්ගලික සමාගම් 02කට අදාළව ද, රු.2,729,665ක් තනිපුද්ගල ව්‍යාපාරයන් 05ක් වෙත ද, රු.5,134,350ක් ඉදිකරමින් පවතින එක් හෝටල් පරිශ්‍රයක් වෙත කරන ලද ගෙවීම්වලින් සමන්විත විය. | ව්‍යාපාරික ස්ථාන සඳහා ගෙවීම්කර ඇත්තේ නිවාස සඳහා ගෙවීම් කිරීමෙන් අනතුරුව ය. අවශ්‍යතාවයන්ගේ ප්‍රමුඛතාවය අනුව නිවසට සිදු වූ හානිය කඩිනමව හානිපූරණය කළ යුතු දේපළක් ලෙස සැලකූ අතර, ගොනු තුළ පැවති ලේඛන අනුව නිවසක් සමග පවත්වාගෙන ගිය වැඩපොළවල් හා රක්ෂණයක් මගින් ආවරණය නොකරන ලද, ව්‍යාපාර කටයුතු ආරම්භකර නොමැති ඉදිකරමින් පවත්නා ව්‍යාපාරික ස්ථානයක් සඳහා ගෙවීම් කිරීමට කටයුතුකර ඇත. දේපළ හානිපූරණය කිරීමේ දී කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ, මහා පරිමාණ, තනි පුද්ගල ව්‍යාපාර ලෙස වර්ගීකරණය කිරීමක් නොව ඉහත සඳහන් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ රීතීන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයකළ ප්‍රමුඛතා පදනම මත ගෙවීම් කිරීමට කටයුතු කරන ලදී. | හානියටපත් දේපළ ඇගයීමට විධිමත් නිර්නායකයන් හඳුන්වා දී ඒ අනුව වන්දි ගෙවීමට කටයුතු කළ යුතු ය. |
| (ආ) | වන්දි ගෙවීම් ක්‍රමවේදය සම්බන්ධයෙන් වූ නියැදි පරීක්ෂාවේ දී එකම පුද්ගලයා වෙත මරණයට පත්වීම හෝ තුවාල සිදුවීම් ද ලෙස සලකා පළමු වන්දි ගෙවීම ද, අතුරුදහන්වීම් ලෙස සලකා දෙවන වන්දි ගෙවීම ද සිදුකරමින් අතිරේකව රු.600,000ක් පුද්ගලයන් තිදෙනෙකු වෙත ගෙවා තිබුණි. | එම ගෙවීම් දෙක ප්‍රතිපත්තිමය තීරණ මත සහන යෝජනා ක්‍රම දෙකක් යටතේ සිදුකරන ලද ගෙවීම් දෙකකි. පළමු ගෙවීම් මරණ හා තුවාල වන්දි යෝජනා ක්‍රමය යටතේ සිදුකරන ලද මියගිය අයගේ ළඟම ඥාතීන් සඳහා කළ ගෙවීමකි. දෙවන ගෙවීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මගින් පරීක්ෂණ පවත්වා එම පවුල් පුනර්ජීවනය සඳහා පුනර්ජීවන දීමනාවක් ගෙවීමට නිර්දේශයක් හානිපූරණ කාර්යාලය වෙත යොමුකරන අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා හානිපූරණය සඳහා වන කාර්යාලයේ හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශවලට අනුකූලව එකී දීමනාව ගෙවීම්කර ඇත. | වන්දි ගෙවීමේ දී වඩාත් විනිවිධභාවයකින් යුතුව වන්දි ගෙවීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | | පුනර්ජීවන දීමනාව ගෙවීමේ දී ගෙවන ලද වන්දි මුදල අඩුකර ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ලබානොමැති බව ද සඳහන් කරමි. | |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හානිපූරණ සඳහා වන කාර්යාලයේ පළමු පරිගණක පද්ධතිය 2016 සැප්තැම්බර් 16 දින ක්‍රියාත්මකකර තිබූ නමුත්, එවක සිට කාර්යාලයේ අත්‍යාවශ්‍ය තනතුරක් වන තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරක් අනුමත කාර්යමණ්ඩලය තුළ නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ ජූලි 12 දින හානිපූරණ කාර්යාලය විසින් තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරු 01ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හරහා අනුමත කරගෙන තිබූ නමුත්, ඊට අදාළ බඳවාගැනීම් පටිපාටිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අනුමතකර ගෙන නොතිබුණි. | එම තනතුර සඳහා බඳවාගැනීම් පටිපාටිය 2025 පෙබරවාරි 18 දිනැතිව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශකර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යොමුකර ඇත. 2025 මාර්තු 26 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නැවත බඳවාගැනීම් පටිපාටිය සංශෝධනය කිරීමට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව 2025 අප්‍රේල් 23 දිනැතිව සංශෝධනය කරන ලද පටිපාටිය අධිකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත. අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුමත වූ පසු බඳවාගැනීම් කටයුතු කරන බව දන්වා සිටිමි. | ආයතනයේ පුරප්පාඩු හඳුනාගෙන විධිමත් අනුමැතියක් මත කඩිනමින් බඳවාගැනීම් සිදුකිරීමට පියවරගත යුතු ය. |
| (ආ) | හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යමණ්ඩලය 76ක් වුව ද, එදිනට තනතුරු 08ක නිලධාරීන් 28දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි. | පුරප්පාඩු සඳහා බඳවාගැනීමට අනුමැතිය ඉල්ලා අමාත්‍යාංශය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා අග්‍රාමාත්‍ය සමාලෝචන කමිටුව වෙත අවස්ථා ගණනාවක දී ඉල්ලීම් කරන ලදී. රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛ හා 2024 වර්ෂයෙහි පැවති ජනාධිපතිවරණය හා මහ මැතිවරණය හේතුවෙන් අදාළ පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතියක් ලබාගැනීමට නොහැකි විය. අනුමැතිය ලද පසු 2025 වර්ෂයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හැකියාවක් ඇත. | ඵලදායී සේවා මට්ටමක් පවත්වාගැනීම සඳහා සේවක මණ්ඩලය සමාලෝචනයක් සිදුකර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකිරීමට කළමනාකරණය පියවරගත යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතු වාර්ෂික කෙටුම්පත් වාර්තාවේ අවම වශයෙන් හෙළිදරව් කළ යුතු අංග වන ආයතනයේ සභාපති අදහස් දැක්වීම, අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව හා පසුගිය ආසන්නතම අවුරුදු 10ක ආයතනයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත්කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොමැත. | අංක 01/2021 දරන රාජ්‍ය චක්‍රලේඛයේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 4.2 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීතාවය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආතුරුදහන් වූවන්ගේ වන්දි යෝජනා ක්‍රමය හැර අනෙකුත් කිසිදු වන්දි යෝජනා ක්‍රමයක් 2023 අප්‍රේල් 28 දින ක්‍රියාත්මක කළ දෙවන පරිගණක පද්ධතිය තුළ ඇතුළත් කිරීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතුකර නොතිබුණු අතර, වන්දි ක්‍රමවේදයන්ට අදාළ පළමු පද්ධතියේ දත්තයන් දෙවන පරිගණක පද්ධතිය වෙත එකතු කිරීමක් (Data Migration) දෙවන පරිගණක පද්ධතිය ස්ථාපිත කළ දින සිට මෙතෙක් සිදුකර නොතිබුණි. | වන්දි ක්‍රමවේදයන්ට අදාළ පළමු පද්ධතියේ දත්තයන් දෙවන පරිගණක පද්ධතිය වෙත එකතු කිරීමේ කටයුතු 2025 මැයි 04 දින වනවිට අවසන්කර ඇත. මේ වන විට එහි දත්ත පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. එම කටයුතු ද මෙම මාසය තුළ දී අවසන්කළ හැකි බව දන්වමි. පරිගණක පද්ධතිය පිළිබඳ කටයුතු සිදුකිරීම සඳහා අත්‍යාවශ්‍ය සේවකයන්ගේ හිඟයක් ආයතනය තුළ පැවතීම මෙම ප්‍රමාදයන්ට හේතු වී ඇති බව ද සඳහන් කරමි. | පරිගණක පද්ධතිය පිළිබඳ කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවරගත යුතු ය. |
| (ආ) | 2023 අප්‍රේල් 28 දින සිට ක්‍රියාත්මක කරන ලද රු.10,819,625ක් වටිනා පරිගණක දත්ත පද්ධතිය සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) ප්‍රදානයක් ලෙස ලැබී තිබූ අතර, වත්කමේ වටිනාකම තහවුරුකර ගැනීම සඳහා වූ විධිමත් ලේඛන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. තව ද, මෙම පරිගණක දත්ත පද්ධතිය ලබාදුන් ආයතනය හා හානිපූරණ සඳහා වන කාර්යාලය අතර දෙපාර්ශවය විසින් එකඟ වූ ගිවිසුමක් විගණනය වෙත ඉදිරිපත් නොවූ | මෙම දත්ත පද්ධතිය සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙන් (IOM) ලද ප්‍රදානයක් වූ බැවින් දත්ත පද්ධතියේ නඩත්තු කටයුතු, නවීකරණ කටයුතු හා බිඳවැටීම් සම්බන්ධව ගිවිසුම්ගත වී ඇත්තේ සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයෙන් (IOM) ආයතනය හා Iterminal Technologies ආයතනය යි. කෙසේ නමුත් අපගේ පළමු පද්ධතියේ දත්තයන් දෙවන පරිගණක පද්ධතිය වෙත එකතුකිරීමේ කටයුතු | විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| බැවින්, නව දත්ත පද්ධතියේ නඩත්තු කටයුතු, නවීකරණ කටයුතු හා බිඳවැටීම් සම්බන්ධව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග විගණනයට තහවුරු නොවුණි. | සම්පූර්ණයෙන් අවසන් වූ පසු Iterminal Technologies ආයතනය සමග ගිවිසුම්ගතවීමට නියමිත අතර ඒ සඳහා වූ කෙටුම්පත මේ වන විට අප වෙත ලැබී ඇත. | |

**4.3** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද 40(1) ප්‍රකාරව කාර්යාලයේ අභ්‍යන්තර විගණන කටයුතු කිරීම සඳහා එම පාලක මණ්ඩලය විසින් පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු නමුත්, 2024 අගෝස්තු 29 දින සිට කාර්යාලයේ කාර්යමණ්ඩලය තුළ අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | හානිපූරණය සඳහා වන කාර්යාලයේ අභ්‍යන්තර විගණක නිලධාරිනිය 2024 අගෝස්තු 28 දින සේවයෙන් ඉවත් වූ අතර, එම පුරප්පාඩු වන තනතුර සඳහා බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සලසාදෙන මෙන් 2024 අගෝස්තු 02 දිනැතිව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් ඉල්ලුම්කර ඇත. නමුත් ඒ සඳහා මේ වන තෙක් අනුමැතිය අප වෙත ලැබී නොමැති අතර, අදාළ අනුමැතිය ලැබුණු පසු අභ්‍යන්තර විගණක තනතුර සඳහා බඳවාගැනීම් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අභ්‍යන්තර විගණනයේ පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවරගත යුතු ය. |

**4.4** අයවැය පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් 2024 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය අනුව වන්දි ගෙවීම් ක්‍රියාවලිය සඳහා රුපියල් මිලියන 2,483ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර, ඒ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට භෞතික ප්‍රගතිය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 2024 වර්ෂය තුළ මරණ, තුවාල සහ අතුරුදහන්වීම් වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදමට වඩා රුපියල් මිලියන 4.26ක් එනම් සියයට 85ක් වැයකර තිබුණි. | වර්ෂය තුළ මාසිකව අක්මුදල් ලැබුණු පසු සම්පූර්ණ කරන ලද ගෙවීම් සඳහා ඉදිරිපත් වී ඇති ලිපිගොනු පදනම්කර ගනිමින් මානුෂික හා ආයතනික අවශ්‍යතාවය මත වන්දි ගෙවීම් සඳහා වන මුදල් වෙන්කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුළ මූල්‍ය ප්‍රදාන (වන්දි ගෙවීම්) සඳහා ලබාදුන් ප්‍රතිපාදන සීමාව තුළ ආයතනික අවශ්‍යතාවය හා ඉහළ කළමනාකාරිත්වයේ එකඟතාවය මත විවිධ වන්දි යෝජනා ක්‍රමවලට අදාළව මුදල් මාරු කරගනු ලබයි. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස්කර ප්‍රතිපාදන වෙන්කිරීමට පියවරගත යුතු ය. |
| (ii) | අතුරුදහන් වූවන් සඳහා වන්දි ගෙවීමට 2024 වර්ෂය තුළ රුපියල් මිලියන 1,000ක් වෙන්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉන් රුපියල් මිලියන 310ක් උපයෝජනයකර නොතිබුණු අතර එය වෙන්කරන ලද මුදලින් සියයට 31ක ප්‍රතිශතයකි. | | |
| (iii) | 2022 සිදුවීම සම්බන්ධයෙන් වූ වන්දි ප්‍රදානය සඳහා 2024 වර්ෂය තුළ රුපියල් මිලියන 600ක් වෙන්කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට එයින් රුපියල් මිලියන 227ක් උපයෝජනයකර නොතිබුණු අතර, එය වෙන්කරන ලද මුදලින් සියයට 38ක ප්‍රතිශතයකි | වර්ෂය තුළ මාසිකව අක්මුදල් ලැබුණු පසු සම්පූර්ණ කරන ලද ගෙවීම් සඳහා ඉදිරිපත් වී ඇති ලිපිගොනු පදනම්කර ගනිමින් මානුෂික හා ආයතනික අවශ්‍යතාවය මත වන්දි ගෙවීම් සඳහා වන මුදල් වෙන්කරනු ලබයි. ඒ අනුව වර්ෂය තුළ මූල්‍ය ප්‍රදාන (වන්දි ගෙවීම්) සඳහා ලබාදුන් ප්‍රතිපාදන සීමාව තුළ ආයතනික අවශ්‍යතාවය හා ඉහළ කළමනාකාරිත්වයේ එකඟතාවය මත විවිධ වන්දි යෝජනා ක්‍රමවලට අදාළව මුදල් මාරු කරගනු ලබයි. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව සකස්කර ප්‍රතිපාදන වෙන්කිරීමට පියවරගත යුතු ය. |
| (iv) | දේපළ හානි යටතේ රජයේ නිලධාරීන් සඳහා වන වන්දි ක්‍රමවේදය ඔස්සේ රු.10,763,000ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ගෙවා තිබුණු අතර, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස්කළ අයවැය ලේඛනය තුළ ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණි. | | |
| (ආ) | ආයතනයේ ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 2,588ක් වුව ද, තථ්‍ය වියදම රුපියල් මිලියන 2,145.14ක් විය. වියදම් විෂයන් 52ක් අතරින් විෂයන් 29ක අයවැය වියදම හා තථ්‍ය වියදම අතර සියයට 20 සිට සියයට 757ක් අතර ප්‍රමාණයකින් වෙනස්වීම නිසා අයවැය ඇස්තමේන්තු තාත්විකව සකස්කර පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. විශේෂයෙන් පාරිතෝෂිත දීමනාව හා ගොඩනැගිලි කුලී වියදම්වල අයවැය වියදම හා තථ්‍ය | අයවැයගත පාරිතෝෂික දීමනාව හා තථ්‍ය වියදමේ වෙනසට නිලධාරීන් 08දෙනෙකු සේවයෙන් ඉවත්වීම හේතු විය. වසර 60 සම්පූර්ණවීමට පෙර නිලධාරීන් 07දෙනෙකු ඉවත්වීම නිසා ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට පුරෝකථනයන් අප වෙත නොවී ය. ගොඩනැගිලි කුලී වියදම ඇස්තමේන්තුගත කිරීමේ දී භාණ්ඩාගාරය විසින් ලබාදුන් වැය විෂය සීමාවන්ට අනුව සකස්කළ | අයවැය ඇස්තමේන්තු වඩාත් නිවැරදිව සකස්කර ප්‍රතිපාදන වෙන්කර ගැනීමට පියවරගත යුතු ය. |

වියදම අතර සියයට 758ක සහ සියයට 543ක අතර ප්‍රමාණයක වෙනසක් පැවතුණි.

බැවින් ප්‍රමාණාත්මකව තථ්‍ය වියදමට වඩා අඩුඅගයක් ඇස්තමේන්තුව තුළ පෙන්නුම් කරයි. ලැබෙන සීමිත ප්‍රතිපාදන සීමාව තුළ අයවැය සකස්කළ යුතු අතර, මෙකී මාසික ගොඩනැගිලි කුලිය රේඛීය අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරන බැවින් අප විසින් එකී මාසික ප්‍රතිපූරණය කිරීම ද අයවැය සකස්කරන අවස්ථාවේ දී සලකා බැලීමට කටයුතු කරන ලදී.